IHRA
UNIVERSITY OF COLOMBO

# මානව සම්පත් අභිවර්ධන ආයතනය

## කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## ශ්‍රම අධ්‍යාපනවේදී උපාධි පරීක්ෂණය - III කොටස - 2017/2018

(දෙවන සෙමෙස්තරය)

(පවත්වන ලද්දේ 2020 ජූලි)

## BLE 307 - අලෙවි කළමනාකරණය

අයදුම්කරුවන්ට උපදෙස් :

**(01)** ප්‍රශ්න හතරකට **(04)** පමණක් පිළිතුරු සැපයිය යුතුය.

(02) කාලය පැය තුනයි. (03)

(03) මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න හයකින් (06) සහ පිටු දෙකකින් (02) සමන්විත වේ.

(04) පිළිතුරු පත්‍රයේ සියලුම පිටුවල විභාග අංකය යොදන්න.

(05) ප්‍රශ්න පත්‍රයේ යම් පිටුවක් හෝ කොටසක් පැහැදිලිව මුද්‍රණයවී නොතිබේ නම් කරුණාකර වහාම ඒ බව ශාලාධිපතිට දැනුම් දෙන්න.

01.

i. වර්තමාන තරඟකාරී ව්‍යාපාරික පරිසරය තුල අලෙවිකරුවෙකුගේ කාර්යභාරය උදාහරණ සපයමින් පැහැදිලි කරන්න.

(ලකුණු 10)

ii. නව නිපැයුම් සංවර්ධන ක්‍රියාවලිය සැකෙවින් විස්තර කර ව්‍යාපාර ආයතනයකට එහි දීර්ඝකාලීන පැවැත්ම සඳහා නව නිපැයුමක අවශ්‍යතාවය පැහැදිලි කරන්න.

(ලකුණු 15)
(මුළු ලකුණු 25)

02.

i. පාරිභෝගික මිලදී ගැනීමේ තීරණ ක්‍රියාවලිය සුදුසු උදාහරණයක් දක්වමින් විස්තර කරන්න.

(ලකුණු 10)

ii. අලෙවිකරණ පරිසරයේ උපාංග විස්තර කර එක් ව්‍යාපාරික ආයතනයක් ඇසුරෙන් බාහිර පරිසර විශ්ලේෂනයක් සිදුකරන්න.

(ලකුණු 15)
(මුළු ලකුණු 25)

03. මයිකල් පෝටර් විසින් හඳුන්වා දෙනු ලැබූ පස්වැදෑරුම් තරඟකාරිත්ව බලවේගයන් යොදාගනිමින් තරඟකාරිත්ව විශ්ලේෂණයක් ඔබ තෝරාගන්නා ලද කර්මාන්තයක් වෙනුවෙන් සිදුකරන්න.

(ලකුණු 25)

04. ව්‍යාපාරික ආයතනයක් තරඟකාරිත්වයට මුහුණදීමේ අලෙවිකරණ ක්‍රමෝපායන්, ශ්‍රී ලංකාවේ සුපිරි වෙළඳසැල් කර්මාන්තය ඇසුරෙන් උදාහරණ සමඟින් විස්තර කරන්න.

(ලකුණු 25)

05.

i. ආයතනයක් විසින් යොදාගනු ලබන අලෙවිකරණ සන්නිවේදන ක්‍රම, එහි ප්‍රායෝගික භාවිතය සමඟ සැකෙවින් විස්තර කරන්න.

(ලකුණු 10)

ii. අලෙවිකරණ සන්නිවේදනය හඳුන්වා, ව්‍යාපාර ආයතනයට සිය පාරිභෝගික ගනුදෙනුකාර සම්බන්ධතා වර්ධනය කිරීමට සන්නිවේදනය වැදගත්වන ආකාරය පැහැදිලි කරන්න.

(ලකුණු 15)
(මුළු ලකුණු 25)

06.

i. ව්‍යාපාර ආයතනයක භාණ්ඩයක් මිලකිරීමේදී යොදා ගත හැකි උපක්‍රම උදාහරණ සහිතව විස්තර කරන්න.

(ලකුණු 10)

ii. භාණ්ඩයක නිපැයුම් ජීවන චක්‍රයෙහි (product life cycle) එක් එක් අදියරයන් විස්තර කර, ඒ ඒ අදියරේදී යොදාගත හැකි උපක්‍රමයන් දක්වන්න.

(ලකුණු 15)
(මුළු ලකුණු 25)

*******

IHRA
UNIVERSITY OF COLOMBO

**මානව සම්පත් අභිවර්ධන ආයතනය**

**කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව**

# ශ්‍රම අධ්‍යාපනවේදී උපාධි පරීක්ෂණය - III කොටස - 2017/2018

(දෙවන සෙමෙස්තරය)

(පවත්වන ලද්දේ 2020 ජූලි)

## BLE 308 - ශ්‍රමයේ නූතන ප්‍රවණතා

අයදුම්කරුවන්ට උපදෙස් :

(1) මෙම ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් සමන්විතය. (අ) කොටසේ ප්‍රශ්න තුනෙන් එක් ප්‍රශ්නයකට පිළිතුරු සැපයිය යුතු අතර (ආ) කොටසේ ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සැපයිය යුතුය.

(2) ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න නවයකින් (09) සහ පිටු තුනකින් (03) සමන්විත වේ.

(3) කාලය පැය තුනයි (03).

(4) පිළිතුරු පත්‍රයේ සියලුම පිටුවල විභාග අංකය යොදන්න.

(5) ප්‍රශ්න පත්‍රයේ යම් පිටුවක් හෝ කොටසක් පැහැදිලිව මුද්‍රණය වී නොතිබේ නම් කරුණාකර වහාම ඒ බව ශාලාධිපතිට දැනුම් දෙන්න.

## (අ කොටස)

01. "2018 වසරට සාපේක්ෂව 2019 වසරේදී ශ්‍රී ලංකා කාන්තා ශ්‍රම බලකා සහභාගීත්වය සියයට 3.9 (3.9%) කින් ඉහල ගිය අතර, එය 2019 වසරේ සමස්ත ශ්‍රම බලකා සහභාගීත්වය සියයට 56 (56%) ක වැඩිවීමකට දායක විය" (මහ බැංකු වාර්ෂික වාර්තාව, 2019). ශ්‍රී ලංකා කාන්තා ශ්‍රම බලකා සහභාගීත්වය ඉහල යාමේ ප්‍රතිවිපාක උදාහරණ සහිතව පහදන්න.

(ලකුණු 25)

02. "ශ්‍රී ලාංකික පුහුණු වෘත්තිකයන් විදෙස් රටවලට සංක්‍රමණය වීම දිනෙන් දින ඉහල යාමක් පෙන්නුම් කරයි." මෙම ප්‍රකාශය සමඟ ඔබ එකඟවේද? මෙම ප්‍රකාශය උදාහරණ සහිතව පහදන්න.

(ලකුණු 25)

03. 2015 සැප්තැම්බර් මාසයේදී නිව්යෝක් නුවර එක්සත් ජාතීන්ගේ සංවිධාන ප්‍රධාන කාර්යාලයේදී එක් රැස් වූ ලෝක නායකයින් විසින් වසර 2000 දී හඳුන්වාදෙන ලද සහශ්‍ර සංවර්ධන අභිමතාර්ථ සඳහා අනුප්‍රාප්තික අභිමතාර්ථ ලෙස, තිරසාර සංවර්ධන අභිමතාර්ථ දාහතක් (17) එළි දක්වන ලදී. මෙම තිරසාර සංවර්ධන අභිමතාර්ථ ලඟා කර ගැනීමේදී ශ්‍රී ලංකාව මුහුණ දෙන අභියෝග කවරේද? උදාහරණ යොදා ගනිමින් පහදන්න.

(ලකුණු 25)

## (ආ කොටස)

04. i. ආයතනික සමාජ වගකීම් යන්න නිර්වචනය කරන්න.

(ලකුණු 03)

ii. ආයතනික සදාචාරාත්මක හැසිරීම් තීරණය කරන සාධක කවරේද? ඉන් එක් (01) සාධකයක් කෙටියෙන් පහදන්න.

(ලකුණු 04)

iii. "වර්තමානයේ බොහෝ ව්‍යාපාර සංවිධාන ආචාරධර්මද, සමාජයීය වගකීම් සංකල්පයේ කොටසක් ලෙස සලකන අතර සිය සාමාජිකයන් සඳහා ආචාර ධර්ම මාලාවක් (Code of Ethics) නිර්මාණය කිරීමට පෙළඹී සිටී." මෙම ප්‍රකාශය සමඟ ඔබ එකඟවේද? උදාහරණ යොදා ගනිමින් මෙම ප්‍රකාශය පහදන්න.

(ලකුණු 08)

(මුළු ලකුණු 15)

05. i. වැඩවලදී "හිරිහැර" කිරීම යන්නෙන් කුමක් අදහස් වේද? නිර්වචනය කරන්න.

(ලකුණු 03)

ii. බියගැන්වීමේ පිරිවැය කවරේද? ඉන් එක් පිරිවැය .තත්වයක් කෙටියෙන් පහදන්න.

(ලකුණු 04)

iii. රැකියා ස්ථානයේ ඇතිවන අසතුටුදායක ගැටුම්, කළමනාකරණය කිරීම සඳහා ඔබට යොදාගත හැකි පෞද්ගලික ගැටුම් උපායමාර්ග කවරේද? පහදන්න.

(ලකුණු 08)
(මුළු ලකුණු 15)

06. i. ආයතනික නිරීක්ෂණ ප්‍රතිපත්තිය තුල අන්තර්ගත කල හැකි නිරීක්ෂණ ක්‍රම (03) සඳහන් කරන්න.

(ලකුණු 03)

ii. ආයතනික නිරීක්ෂණ ප්‍රතිපත්තියක් ස්ථාපිත කිරීමේ වාසි සහ අවාසි සඳහන් කරන්න.

(ලකුණු 04)

iii. "ආයතනික නිරීක්ෂණ ප්‍රතිපත්තියක් ස්ථාපිත කිරීමේදී විවෘතභාවය යන පොදු මූලධර්මය ආරක්ෂා කිරීම වැදගත් වේ." මෙම ප්‍රකාශය සමඟ ඔබ එකඟවේද? උදාහරණ යොදා ගනිමින් පහදන්න.

(ලකුණු 08)
(මුළු ලකුණු 15)

07. i. හැඟීම් ජනිතවීම කෙරෙහි බලපාන ප්‍රධාන මූලාශ්‍ර කවරේද? එන් එය (01) මූලාශ්‍රයක් කෙටියෙන් පහදන්න.

(ලකුණු 03)

ii. චිත්තවේගීය ශ්‍රමය ක්‍රියාත්මක කිරීමේදී ඇතිවිය හැකි නිශේධාත්මක ප්‍රතිඵල හා සාධනීය ප්‍රතිඵල සඳහන් කරන්න.

(ලකුණු 04)

iii. Hochschild (1983) අනුව "චිත්තවේගීය ශ්‍රමය ඉටුකිරීමේ ප්‍රධාන ආකාර දෙක ලෙස මතුපිට ක්‍රියාකාරීත්වය හා ගැඹුරු ක්‍රියාකාරීත්වය දැක්විය හැක.' මෙම ප්‍රකාශය පහදන්න.

(ලකුණු 08)
(මුළු ලකුණු 15)

08. i. ශ්‍රම බලකා විවිධත්වය යන්න නිර්වචනය කරන්න.

(ලකුණු 03)

ii. විවිධත්ව කළමනාකරණයේදී ආයතන මුහුණ දෙන ප්‍රධාන අභියෝග කවරේද? ඉන් එක් අභියෝගයක් කෙටියෙන් පහදන්න.

(ලකුණු 04)

iii. "ගෝලීයකරණයත් සමඟම බොහෝ ව්‍යාපාර සංවිධානවල ශ්‍රම බලකාය විවිධ සංස්කෘතීන් නියෝජනය කරන පුද්ගලයන්ගෙන් සමන්විත වී ඇති අතර ශ්‍රම බලකා විවිධත්වය කළමනාකරණයට උපක්‍රම සැකසීම කෙරෙහි ව්‍යාපාර තම අවධානය යොමුකර ඇත." ඔබ මෙම ප්‍රකාශය සමඟ එකඟවේද? පහදන්න.

(ලකුණු 08)
(මුළු ලකුණු 15)

09. i. රැකියා-ජීවිත සමබරතාව යන්නෙන් කුමක් අදහස්වේද? නිර්වචනය කරන්න.

(ලකුණු 03)

ii. රැකියා-ජීවිත සමබරතාව පවත්වා ගැනීම තුළින් ආයතනයට හා සේවකයාට ලබාගත හැකි ප්‍රයෝජන කවරේද?

(ලකුණු 04)

iii. ජීවන වියදම වැඩිවීමත් සමගම සැමියා මෙන්ම භාර්යාවද රැකියාවල නිරතවීම වර්තමානය වනවිට සුලභව දැකිය හැකි අතර බොහෝ ව්‍යාපාර සංවිධාන රැකියාවන්හි නිරතවන අතරතුර තම නිවෙසේ කාර්යභාරය ඉටුකිරීමට හැකිවන සේ වැඩසටහන් නිර්මාණය කරමින් සිටී. එවැනි වැඩසටහන් සඳහා උදාහරණ දක්වමින් ඉහත ප්‍රකාශය පහදන්න.

(ලකුණු 08)
(මුළු ලකුණු 15)

******

70

IHRA
UNIVERSITY OF COLOMBO

# මානව සම්පත් අභිවර්ධන ආයතනය

## කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## ශ්‍රම අධ්‍යාපනවේදී උපාධි පරීක්ෂණය - III කොටස - 2017/2018

(දෙවන සෙමෙස්තරය)

(පවත්වන ලද්දේ 2020 ජූලි)

## BLE 309 - ශ්‍රී ලංකාවේ ආර්ථික ප්‍රතිපත්ති හා සංවර්ධනය

අයදුම්කරුවන්ට උපදෙස් :

**(01)** ප්‍රශ්න පහකට **(05)** පමණක් පිළිතුරු සැපයිය යුතුය.

(02) කාලය පැය තුනයි. (03)

(03) මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න අටකින් (08) සහ පිටු හතරකින් (04) සමන්විත වේ.

(04) පිළිතුරු පත්‍රයේ සියලුම පිටුවල විභාග අංකය යොදන්න.

(05) ප්‍රශ්න පත්‍රයේ යම් පිටුවක් හෝ කොටසක් පැහැදිලිව මුද්‍රණයවී නොතිබේ නම් කරුණාකර වහාම ඒ බව ශාලාධිපතිට දැනුම් දෙන්න.

01.

i. ආර්ථික චක්‍රයක නැග්ම, මුදුන, පසුබැස්ම, අවපාතය, පරිහානිය සහ අර්බුදය යන ලක්ෂණ ව්‍යාපාර චක්‍රයක රූපසටහනක් ඇසුරෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 10)

ii. ආර්ථික අවපාතයකින් මිදීම සඳහා රජයකට ගතහැකි මූලික ක්‍රියාමාර්ග පහත දැක්වෙන ප්‍රතිපත්ති ඇසුරෙන් පැහැදිලි කරන්න.

(අ) සැපයුම් අංශයේ ප්‍රතිපත්තිය

(ආ) මිල හා ආදායම් පාලන ප්‍රතිපත්තිය

(ලකුණු 10)
(මුළු ලකුණු 20)

02. i. ආර්ථිකයක ව්‍යුහය යන්නෙන් ඔබ හඳුනාගන්නේ කුමක්ද?

(ලකුණු 04)

ii. ආර්ථිකයක ව්‍යුහාත්මක වෙනස්කම් ඇතිකිරීමට බලපෑ හැකි සාධක කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 04)

iii. ශ්‍රී ලංකාවේ ආර්ථිකයේ මෑත කාලයේදී ඇතිවූ ව්‍යුහාත්මක වෙනස්කම් සඳහන් කර ඒවාට බලපෑ සාධක නම් කරන්න.

(ලකුණු 04)

iv. ශ්‍රී ලංකාවේ දිළිඳුකම අඩුකිරීම සඳහා සිදුකල යුතු ව්‍යුහාත්මක වෙනස්කම් කවරේද? එම වෙනස්කම් සිදු නොවන්නේ කවර හේතු නිසාවෙන්ද?

(ලකුණු 04)

v. ශ්‍රමිකයන් විදේශගතවීම සහ ඔවුන්ගෙන් ලැබෙන විදේශ ප්‍රේෂණ මෙරට ආර්ථිකයේ ව්‍යුහාත්මක වෙනස්කම් ඇතිකිරීමට බලපෑ ආකාරය පැහැදිලි කරන්න.

(ලකුණු 04)
(මුළු ලකුණු 20)

03.

i. කෝවිඩ් 19 සෞඛ්‍ය අර්බුදය ශ්‍රී ලංකාවේ ආර්ථිකයේ පහත දැක්වෙන අංශ කෙරෙහි ඇතිකරන ලද බලපෑම විස්තර කරන්න.

(අ) නිෂ්පාදනය හා මිල මට්ටම

(ආ) ආනයන හා අපනයන

(ඇ) සංචාරක ව්‍යාපාරය

(ඈ) සේවා නියුක්තිය සහ පුද්ගලික ආදායම

(ඉ) බැංකු සහ මූල්‍ය ක්ෂේත්‍රය

(ලකුණු 2x5 = 10)

ii. කෝවිඩ් 19 හේතුකොට ගෙන ඇතිවූ ආර්ථික අර්බුදයෙන් මිදීම සඳහා ශ්‍රී ලංකාවේ රජය ගත් ක්‍රියාමාර්ග පහත දැක්වෙන ප්‍රතිපත්ති උපකරණ ඇසුරෙන් පැහැදිලි කරන්න.

(අ) රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය

(ආ) මූල්‍ය ප්‍රතිපත්තිය

(ලකුණු 10)

(මුළු ලකුණු 20)

04.

i. 2019 වර්ෂයේ ශ්‍රී ලංකාවේ ආර්ථිකයේ සමස්ථ හැසිරීම පිළිබඳ කෙටි රචනයක් ලියන්න.

(ලකුණු 08)

ii. 2015-2019 කාල පරිච්ඡේදය තුල ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනය අඛණ්ඩව පහත වැටීමට සෘජුවම බලපෑ සාධක නම් කරන්න. ඒවා කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 08)

iii. දීර්ඝකාලීන වශයෙන් ශ්‍රී ලංකාවට ගෙවුම්ශේෂ අර්බුදයක් උරුමවීම කෙරෙහි බලපෑ සාධක මොනවාද?

(ලකුණු 04)

(මුළු ලකුණු 20)

05.

i. පුද්ගලයෙකුගේ ප්‍රධාන ආදායම් මූලාශ්‍ර නම්කර ඒවා ඇසුරෙන් ආර්ථිකයක ආදායම් විෂමතාවයන් මතුවන ආකාරය පැහැදිලි කරන්න.

(ලකුණු 04)

ii. රටක ආදායම් විෂමතාවය මැනීම සඳහා භාවිතාකරණ නිර්ණායක හතරක් (04) ක් පැහැදිලි කරන්න.

(ලකුණු 04)

iii. රටක ආදායම් විෂමතාවය අවමකිරීම සඳහා රජයකට භාවිතකල හැකි උපකරණ මොනවාද?

(ලකුණු 04)

iv. ශ්‍රී ලංකාවේ ආදායම් ව්‍යාප්තියේ දිගුකාලීන හා කෙටිකාලීන උපනතීන් හඳුනාගන්න. ඒවාට බලපෑ සාධක නම් කරන්න.

(ලකුණු 04)

v. මෙරට ආදායම් විෂමතාවය අවම කිරීම සඳහා ගතහැකි ක්‍රියාමාර්ග යෝජනා කරන්න.

(ලකුණු 04)
(මුළු ලකුණු 20)

06.

i. ආර්ථිකයක විදේශ විනිමය පාලනය කල යුත්තේ කුමන හේතු නිසාද?

(ලකුණු 05)

ii. ශ්‍රී ලංකා රුපියල විදේශ මුදල්වලට සාපේක්ෂව අවප්‍රමාණය වීම නිසා ශ්‍රී ලංකාවට මුහුණ දීමට සිදුවන තත්ත්වයන් පැහැදිලි කරන්න.

(ලකුණු 05)

iii. විදේශ විනිමය පාලනයට අදාලව ශ්‍රී ලංකාව මෑතකදී ගත් ක්‍රියාමාර්ග උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

(ලකුණු 05)

iv. ශ්‍රී ලංකාව මුහුණදී ඇති විදේශ විනිමය අර්බුදයෙන් මිදීම සඳහා ඔබ ඉදිරිපත්කරන යෝජනා මොනවාද?

(ලකුණු 05)
(මුළු ලකුණු 20)

07.

i. ශ්‍රී ලංකාවේ රාජ්‍ය වියදමේ ප්‍රධාන සංරචක (කොටස්) වල මෑතකාලීන වෙනස්කම් හා ඒවාට බලපෑ සාධක පැහැදිලි කරන්න.

(ලකුණු 05)

ii. ශ්‍රී ලංකාවේ පනවා ඇති ප්‍රධාන බදු වර්ග හඳුන්වා ඒවායේ ආර්ථික ප්‍රතිවිපාක පැහැදිලි කරන්න.

(ලකුණු 05)

iii. මෑත වර්ෂවල ශ්‍රී ලංකාවේ රාජ්‍ය අයවැය පරතරය පියවාගැනීම සඳහා භාවිතකල උපකරණ මොනවාද? ඵලදායී රාජ්‍ය මූල්‍ය ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම සඳහා ඒවා වෙනස් විය යුතු ආකාරය පැහැදිලි කරන්න.

(ලකුණු 05)

iv. රජයක් පුළුල් වන අයවැය පරතරයක් පවත්වාගෙන යාම හේතුකොට ගෙන ගෙවුම් ශේෂ අර්බුදයක් නිර්මාණය විය හැකිය. මෙම ප්‍රකාශය පැහැදිලි කරන්න.

(ලකුණු 05)

(මුළු ලකුණු 20)

08. i. විදේශ ආධාර සහ විදේශ ආයෝජන අතර වෙනස පැහැදිලි කරන්න.

(ලකුණු 05)

ii. කෝවිඩ් 19 ආර්ථික අර්බුදය විදේශ ආයෝජන හා විදේශ ආධාර සඳහා කරන බලපෑම් හඳුනාගන්න.

(ලකුණු 05)

iii. විදේශ ණය වැඩිවීම නිසා මෙරට ආර්ථිකයට ඇතිවී ඇති අයහපත් තත්වයන් පැහැදිලි කරන්න.

(ලකුණු 05)

iv. රටක් මධ්‍යම ආදායම් බණ්ඩය තුල හිරවීම යන්නෙන් ඔබ වටහා ගන්නේ කුමක්ද? එවැනි ලක්ෂණ ශ්‍රී ලංකා ආර්ථිකයට බලපාන ආකාරය පැහැදිලි කරන්න.

(ලකුණු 05)

(මුළු ලකුණු 20)

******